**ශ්‍රී ලංකා**
**ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**පාර්ලිමේන්තුව**

---

# 1981 අංක 35 දරන ඇසෝෂියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 ජූනි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 35 යි | තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 35 දරන ඇසෝසියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 74/80

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 28 දරන ඇසෝසියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1981 අංක 35 දරන ඇසෝසියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 28 දරන පනතට 4අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 28 දරන ඇසෝසියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ පනතේ 4අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

" ලැබිය යුතු වන්දි මත පොලී ගෙවිය යුතු බව.

4අ. සමාගමේ එක් එක් කොටස වෙනුවෙන් ගෙවිය යුතු වන්දි, ඒ කොටස මහා භාරකරු වෙත සතු කරනු ලැබුවේ යම් දිනයක ද ඒ දිනයෙහි සිට උපචිත වන ලෙස සලකනු ලැබිය යුතු ය. ඒ වන්දි උපචිත වන දින සිට එය ගෙවනු ලබන දිනය තෙක්, නියමිත අනු ප්‍රමාණය අනුව ඒ වන්දි වෙනුවෙන් පොලී ගෙවනු ලැබිය යුතු ය.".

සංශෝධනය අතීතයට බලපෑම.

3. මේ පනතේ 2 වන වගන්තියෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 28 දරන ඇසෝසියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනතට කරන ලද සංශෝධනය, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 28 දරන ඇසෝසියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක වූ දින යෙහි සිට ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.